චක්‍රලේඛ අංක; 12/2015

2015.03.16 වෙනි දින දිය

සියළුම අධිකාරිවරුන්/සහකාර අධිකාරිවරුන්

<u>බන්ධනාගාරතුලට තහනම් ද්‍රව්‍ය රැගෙන ඒම</u>

බන්ධනාගාරතුලට රැගෙන යාම තහනම් කරඇති මත්ද්‍රව්‍ය, මත්පැන්, සිගරට්, බීඩි, දුම්කොළ, ජංගම දුරකථන/සිම්පත්, ජංගම දුරකථන උපාංග වැනි දෑ බන්ධනාගාරය තුලට රැගෙන යාමේදී හෝ බන්ධනාගාරය තුලදී සන්තකයේ තබාගෙන සිට අත්අඩංගුවට ගැණීම හෝ තමාගේ ලොකරයේ හෝ රාජකාරි ස්ථානයේ තමාගේ භාරයේ ඇති යම් ස්ථානයක තිබී හමුවූ අවස්ථාවකදී, බන්ධනාගාර අධිකාරිවරයා විසින් සිදුකරන මූලික විමර්ශණයක් තුලින් එය තහවුරු වුවහොත්, නිළධාරියාගේ සේවය අත්හිටුවන බවත්, ඒ සම්බන්ධව ආයතන සංග්‍රහයේ xLviii පරිච්ඡේදයේ පළමු උපලේඛණය යටතේ චෝදනා පත්‍ර ලබාදෙන බවත්, ඉන් අනතුරුව පවත්වන විධිමත් විනය පරීක්ෂණයේදී අදාළ නිළධාරියා වරදකරු වුවහොත් සේවයෙන් පහකිරීම දක්වා දැඩි දඩුවම් ලබාදෙන බවත් , එය නිළධාරීන්ගේ තරාතිරම නොබලා ක්‍රියාත්මක කරන බවත් ඔබගේ නිළ පෙරෙට්ටුවලදී සියළු නිළධාරීන් දැණුවත් කරන්න. එසේම මෙය අවසාන දැණුම්දීම බවත් අවධාරණය කරන්න.

තවද, වාට්ටු හා සිරමැදිරි සෝදිසියේදී නීති විරෝධී ද්‍රව්‍ය අසුවුවහොත්, එම වාට්ටු හෝ සිර මැදිරි භාර සියළු නිළධාරීන් වෙත පසුදිනම දෝෂ දර්ශණයට ලක්කර ලිපි නිකුත් කරන බවත්, දිගින් දිගටම මෙම තත්වය පැවතුන හොත්, චෝදනා පත්‍ර නිකුත් කරන බවත් නිළධාරීන්ට දැන්වීමට කටයුතු කරන්න.

නිළධාරීන් දැණුවත් කර එසේකළ බවට මාවෙත වාර්ථා කරන්න.

එම්.බී.ආර්.පුෂ්පකුමාර

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.